SRI LANKA EXPORT DEVELOPMENT BOARD
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

Sri Lanka Export Excellence Initiative 2027
Under EDB New Exporter Development Programme

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) අපනයන විභවයක් සහිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ජාත්‍යන්තර වෙළෙඳපල වෙත යොමු කිරීම අරමුණු කරගත් Sri Lanka Export Excellence Initiative (SLEEI) වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවයි. මෙම වැඩසටහන මගින් ශ්‍රී ලාංකීය ව්‍යාපාර ජාත්‍යන්තර වෙළෙඳපල තුළ විශිෂ්ටත්වයට පත් කිරීමට පුළුල් සහයෝගයක්, පුහුණුවක් සහ වෙළෙඳ පොළ ප්‍රවේශයක් ලබා දීමට අපේක්ෂිතයි.

ප්‍රධාන අරමුණු

- ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම්වලට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තිරසාර අපනයන ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා ඉලක්කගත වැඩපිළිවෙලක් හරහා සහය වීම.
- අපනයන වෙළෙඳපල ප්‍රවේශ අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ජාත්‍යන්තර වෙළඳපල ප්‍රවේශය සඳහා අවස්ථා ලබා දීම.

වැඩසටහන

- අදියර I - ExpoNavigator

  අපනයන වෙළෙඳපල ප්‍රවේශ අවශ්‍යතා, නීති අනුගතවීම් සහ වෙළඳපල අවස්ථා පිළිබඳ පුළුල් දැනුවත්භාවය ලබා දීම.

- අදියර II - ExpoScaleUp

  තෝරගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයනය කිරීමට සූදානම් කිරීම සඳහා අපනයන අලෙවිකරණ සැලසුම් සකස් කිරීම සහ ඇගයීම.

- අදියර III - ExpoConnect

  වෙළඳපල අධ්‍යයන චාරිකා, ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන, විදේශීය වෙළඳ හමු හරහා අපනයන වෙළඳපල ප්‍රවේශයට සහාය ලබා දීම.

කවුරුන් සඳහාද

ඉහත වැඩ සටහන් මාලාවේ අදියර II - ExpoScaleUp සඳහා පහත සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සහ අපනයන විභවය සහිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- 100% ශ්‍රී ලංකා හිමිකාරිත්වය සහිත ව්‍යාපාරයක් වීම.
- අපනයන වෙළෙඳපල සඳහා සුදුසු නිෂ්පාදන පරාසයක් තිබීම.
- ව්‍යාපාරය ආරම්භ කර අවම වශයෙන් වසර 3ක් සපුරා තිබීම.
- ලියාපදිංචි නිෂ්පාදනාගාර පහසුකමක් / සේවා පහසුකමක් තිබීම.
- ජාත්‍යන්තර වෙළඳපල සඳහා අවශ්‍ය තත්ත්ව සහතික ලබා තිබීම. (අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

මීට අමතරව,

- දැනට අපනයන ගමනාන්ත 5 කට වඩා අපනයනය නොකරන කුඩා හා මධ්‍ය පරිමාණ අපනයනකරුන් අයැදුම් කිරීම ද දිරිමත් කෙරේ.

නිෂ්පාදන කාණ්ඩ

- සැකසූ ආහාර සහ පාන වර්ග
- පොල් ආශ්‍රිත නිෂ්පාදන
- කුළු බඩු, සගන්ධ තෙල් හා ආශ්‍රිත නිෂ්පාදන
- තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියා බාහිරකරණය (ICT/ BPO)
- ආයුර්වේද, ශාකසාර ආලේපන හා රූපලාවණ්‍ය නිෂ්පාදන
- හැඟි භාණ්ඩ, හස්ත කර්මාන්ත, විලාසිතා සහ ජීවත රටා ආශ්‍රිත නිෂ්පාදන

අයදුම්පත්‍රය

මාර්ගගත අයදුම්පත් මාර්ගෝපදේශය www.srilankabusiness.com යන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල වෙබ් අඩවියේ "නිවේදන" කොටස ඔස්සේ ලබාගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, අදාළ සියලුම උපකාරක ලියවිලි සමග 2026 දෙසැම්බර් 15 දින හෝ ඊට පෙර ඉහත වෙබ් අඩවියේ ඇති සබැඳිය හරහා මාර්ගගතව යොමුකළ යුතුය. වැඩි විස්තර සඳහා ප්‍රාදේශීය සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂක, නිපුනි මුණසිංහ මෙතවිය අමතන්න : 011-2300716, 011-2300705-11 දිගුව : 335, nipuni@edb.gov.lk

සභාපති සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

NDB - EDB කුලුණ, අංක 42, නවම් මාවත, කොළඹ 02.

වෙබ් අඩවිය : http://www.srilankabusiness.com